# ශ්‍රී ලංකාවේ අපරාධ හා සංවර්ධනය

- ආචාර්ය එච්. එම්. ටී. එන් ආර්. හේරත්

***හැඳින්වීම.***

වෙළඳපළ අර්ථ ක්‍රමයට පිවිසීමෙන් පසු ශ්‍රී ලංකා අර්ථිකය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. එහෙත් රටේ සිදුවන අපරාධ සංඛ්‍යාවද ක්‍රමයෙන් වැඩි වේ. අපරාධ මානව හිමිකම් හා සෘජුවම සම්බන්ධ වේ. එය ආර්ථිකය සෘණාත්මක පැතිකඩ දර්ශණය කරයි. එමෙන්ම ඒවා වර්ධන ක්‍රියාවලියට මෙන්ම සමාජ සුභ සාධනයටද අහිතකර එකකි. අපරාධ සිදුවීම වැඩිවීම හේතු කොට ගෙන ඒ පිළිබඳව පර්යේෂණ හා සම්මන්ත්‍රණ පවත්වන ජාත්‍යන්තර ආයතන ගණනාවක්ද දනට බිහිවී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අන්තර් කලාපීය අපරාධ සහ සාධාරණත්වය පිළිබඳ ආයතනය *(Dunited Nations Inter- regional Crime and Justice Research Institute), International criminal Tribunal for former Yugoslovia* සහ *International Criminal Tribunal for Ruwana.* උදාහරණ වශයෙන් දක්විය හැක. එබැවින් අපරාධ පිළිබඳ ආර්ථික විද්‍යාත්මක විවරණයක් කිරීම මගින් අපරාධ හා ආර්ථික විචල්‍යයන් අතර බැඳියාව පෙන්වාදීම මෙම ලිපියේ අරමුණයි.

**අපරාධ**

අපරාධ පිළිබඳ එම විද්‍යාඥයන්, දණ්ඩන විද්‍යාඥයන් හා ආර්ථික විද්‍යාඥයන් විවිධ අදහස් දක්වා තිබේ. මේ නිසා අපරාධ පිළිබඳව විවිධ නිර්වචන ඉදිරිපත් කර තිබේ. එක් අදහසකට අනුව "සදාචාරාත්මක නොවන බව" අපරාධ ලෙස හැඳින්වේ. තවද එය නීති විරෝධී එකක් වශයෙන්ද හඳුන්වා ඇත. මේ අනුව නීතිය කැඩීම අපරාධයක් යැයිද නිර්වචන කර ඇත. සදාචාරය හා නීතිය රටින් රටට වෙනස් වේ. එබැවින් එක් රටක සදාචාරාත්මක නොවන දෙයක් තවත් රටක සදාචාරාත්මක එකක් වීමටත් එක් රටක නිති විරෝධී දෙයක් තවත් රටක නීති විරෝධී නොවීමටත් පුළුවන. එබැවින් අපරාධය පිළිබඳ නිර්වචන රටින් රටට ද වෙනස් වේ. මේ අනුව සදාචාරාත්මක නොවන බව සහ නිතී විරෝධී බව අපරාධයක් ලෙස පුළුල් වශයෙන් නිර්වචනය කළ හැකිය. එහෙත් මේ නිර්වචන පුළුල් සහ පැහැදිළි ඒවා නොවේ.

අපරාධවල ස්වභාවය අනුව ඒවා විවිධාකාරයෙන් වර්ග කිරීමක් දක්නට ලැබේ. ගොදුරු සහිත සහ ගොදුරු රහිත අපරාධ එක් වර්ගී කරණයකි. මිනි මැරුම්, ගෙවල් බිඳීම්, මං කොල්ල කෑම ගොදුරු සහිත වන අතර මත් ද්‍රව්‍ය පරිහරණය. ගොදුරු රහිත අපරාධවලට නිදසුන් සපයයි. මෙම ද්‍රව්‍ය පරිහරණය ආර්ථික විද්‍යාවේ වචන වලින් "අකුසලතා භාණ්ඩ *(demerit goods)* වශයෙන් හඳුන්වයි. එහෙන්ම සාහසික අපරාධ, දේපල හා සම්බන්ධ අපරාධ නිති විරෝධී භාණ්ඩ හා සේවා ප්‍රවාහනය යනුවෙන්ද වර්ග කළ හැකිය. ශ්‍රී ලංකාවේ පොලිස්පතිගේ වාර්ෂික වාර්තා අප රටේ අපරාධ පිළිබඳව භාවිතා කරණ වරගීකරණයක් සපයයි. අපරාධ ලෙස අර්ථ දක්වා ඇති සියළුම දේ නිත්‍යානු කුල නොවන නිසා ඒවා නීතිවිරෝධී වේ. එබැවින් එම කාර්යයන් වලින් නිෂ්පාදනයක් සිදු වුවත් නැතත් ඒවා ජාතික ගිණුම් වලින් බැහැර කරනු ලබයි. උදාහරණ වශයෙන් හෙරොයින් හා කසිප්පු නිෂ්පාදනය රටේ නිමවුම වැඩි කළත් ඒවා නිති විරෝධී නිසා ජාතික ආදයම් ගිණුම්වල වාර්තා නොවේ.

**අපරාධයේ පිරිවැය**

අපරාධවලින් සිදුවන පිරිවැය පුද්ගල පිරිවැය හා සමාජ පිරිවැය වශයෙන් කොටස් දෙකකට පුළුල් වශයෙන් බෙදිය හැකිය. සමාජ පිරිවැය යනු සමස්ථ ආර්ථිකයටම දැරීමට සිදුවන පිරිවැයයි. අපරාධ හා ඒවා වැළැක්වීමේ ක්‍රියා මාර්ග නොමැති අවස්ථාවේදි ජනිත කෙරෙන දළ ජාතික නිෂ්පාදිතය ඒවා තිබෙන අවස්ථාවේදි දළ ජාතික නිෂ්පාදිතයෙන් අඩුකළ විට ලැබෙන පිළිතුර අපරාධයේ සමාජ පිරිවැයයි. මෙ අනුව අපරාධ වැළැක්වීමේ සාර්ථක ක්‍රියා මාර්ග ජාතික නිෂ්පාදිතය වැඩි කරන්නේ නම් ඒවා ආර්ථික භාණ්ඩ හෝ සේවා වශයෙන් සැළකිය හැකිය. මේ අනුව අපරාධය පිළිබඳ පිරිවැය ඉතා වැදගත් එකකි. 1997 ලෝක සංවර්ධන වාර්තාව පෙන්වා දෙන පරිදි දියුණුවන රටවල ආයෝජන මට්ටම අඩු කිරීමට එම රටවල අපරාධ හේතු වී තිබේ. එමෙන්ම අපරාධ මර්ධනය සඳහා නිති සම්පාදනය කිරීමට උසාවි, හිර ගෙවල්, ඒවායේ නිලධාරින් සහ ආධාරක නිලධාරීන් විනිශ්චය කරුවන්, පොලිසියේ සාමාජිකයන් ගොඩනැගිලි වැනි අය හා දේවල් නඩත්තු කිරීමට යන පිරිවැය ද සමාජ පිරිවැය ලෙස ගිණිය හැකිය.

අපරාධයේ පුද්ගල පිරිවැය ගත් විට කෙනෙක් උපයා ගත් මුදල් සහ අහිමි වු හෝ නැතිවූ දේවල්වල වටිනාකම ඔහුට දැරීමට සිදුවන පිරිවැයයි. එමෙන්ම ජීවිතය අහිමි වීම. ශාරිරික හානි පැමිණවීම, (තුවාල සිදු කිරීම, ඉන්ද්‍රියන් අහිමි වීම, ස්ත්‍රී දූෂණය) නිසා සිදුවන හානියද පුද්ගල පිරිවැය වශයෙන් ගණිය හැකිය. එසේම මෙම ශාරීරික හානි මිල කිරීම ඉතාමත් අපහසු වේ.

මේ හැරෙන්නට අපරාධකරුවාටද පිරිවැයක් තිබේ. අපරාධයක් කිරිම සඳහා අවශ්‍ය ආයුධ මිලට ගැනිම සිර ගත වීම නිසා කාලය අහිමිවීම, ඔහුට විරුද්ධව නීති මගට පිවිසෙන විට අවශ්‍ය නීතිඥ ගාස්තු දැරීම හා තම පවුලේ සාමාජිකයන්ට සිදුවන චිත්ත පීඩාව ආදිය අපරාධ කරුවාගේ පිරිවැයයි.

**අපරාධ වැළැක්වීම**

අපරාධ වැළැක්වීමට ප්‍රථම එය වැළැක්විය යතුද යන්න විමසා බැළිය යුතුය. මේ සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය යොදා ගත හැක. අපරාධ වැළැක්වීමට අවශ්‍ය කරන පිරිවැය එයින් ඇතිවිය හැකි ප්‍රතිලාභ වලට වඩා අඩුනම් අපරාධ වැළැක්වීම රටකට වාසි සහගතය. මේ අනුව පිරිවැය, ප්‍රතිලාභ විශ්ලේෂණය අපරාධ පිළිබඳ විශ්ලේෂණයේදී යොදා ගත හැක. රටක් සැලකිල්ලට ගත විට අපරාධ වැළැක්වීම වැය වන මුදල් ප්‍රමාණය අපරාධ

වැළැක්වීම හේතු කොට ගෙන ජනිත වන ප්‍රතිලාභ වන ජාතික ආදයම වැඩි වීම ඉක්මවා සිටි නම් අපරාධ වැළැක්වීමට එම රටට වාසි දායක වේ.

1. *අපරාධ මර්දනයට විවිධ මාධ්‍යන් යොදා ගත හැක. රූපවාහිනිය, ගුවන් විදුලිය, පොත් පත්, පුවත්පත්, සඟරා, සංගීතය, නාට්‍ය, සත්‍යග්‍රහ පෙළපාලි ඒ අතර වෙයි.*

අපරාධකරුවාගේ පැත්තෙන් බලන විට අපරාධවල නිරතවීම හේතු කොට ගෙන ඔහුට ලැබෙන ප්‍රතිලාභ ඔහුගේ පිරිවැය ඉක්මවා සිටි නම් අපරාධය ඔහුට වාසි දායක වේ. එබැවින් ඔහු තව තවත් අපරාද වල නිරත වේ. දඬුවම් අඩු වීම නීතිමය පියවරයන්ගෙන් බේරීමට ඇති හැකියාව වැඩි වීම නිසා අපරාධකරුවාගේ පිරිවැය අඩුතත්ත්වයකට පත්වේ. අපරාධ වැඩි වීමට මෙය හේතුවන බවට තර්ක කළ හැකිය. දඬුවම් වැඩි කළත් අපරාධ අඩු නොවන බව බොහෝ සමාජ විද්‍යාඥයන් හා දණ්ඩන විද්‍යාඥයන්ගේ අදහසයි. එහෙත් දඬුවම් අඩුකරන විට අපරාධකරුවා අපරාධවල නිරත වීම නිසා ඔහුට ඇතිවන පිරිවැය අඩුවේ. එබැවින් දඬුවම් යම් තත්ත්වයක පවත්වා ගැනීම වැදගත් වේ. ඊට හේතුව දඬුවම් අඩු කිරීම නිසා අපරාධකරුවාගේ ශුද්ධ ප්‍රතිලාභ වැඩිවීමයි.

2. *එක්සත් ජාතීන්ගේ අපරාධ වැළැක්වීම හා වරදිකරුවන්ට පිළියම් කිරීම පිළිබඳ නවවන සමුළු වාර්තාව (1995- 04-13) දක්වන අන්දමට අපරාධ වැළැක්වීම " සමාජ අළෙවිකරණය" මතද රඳා පවතී. එනම් අපරාධ පිළිබඳ සාකච්ඡා පැවැත්වීම, දත්ත ලබා ගැනීමේ ප්‍රභවයන් වැඩි කිරීම හා ආකල්ප හා සාර ධර්ම වර්ධනය කිරීමයි. එහෙත් සාර්ථකව අපරාධ මැඩලීමට රජය සද්භාවයෙන් කටයුතු කළ යුතුය.*

## ශ්‍රී ලංකාවේ අපරාධ

ශ්‍රී ලංකාවේ පසු ගිය දශක තුනක පමණ කාලය තුළ සංවර්ධන ඉලක්කයන් රාශියක් කරා ලගා වුවත් ඇයගේ අපරාධ අනුපාතය ඉහළ යන බව පෙනේ. (වගුව 01 බලන්න.) එමෙන්ම 1990 සිට 1998 දක්වා වර්ෂ නවයෙහි ශ්‍රී ලංකාවේ බරපතල අපරාධ ඒක පුද්ගල ආදායම මත ප්‍රතිපායනය කළ විට $\hat{Y} = 16334 + 3.9x$ ලැබේ. මේ අනුව අපරාධ හා ඒක පුද්ගල ආදායම අතර ධන සම්බන්ධතාවයක් පවතී. එනම් ආදායම වැඩි වන විට අපරාධ ද වැඩිවේ. මෙය 1993 දි එක්සත් ජාතීන්ගේ අපරාධ හා විනිශ්චය පිළිබඳ අන්තර් කලාපීය පර්යේෂණ ආයතනය (*THE UNITED NATIONS INTER-REGIONAL CRIME AND JUSTICE RESEARCH INSTITUTE*) සිය වාර්තාවේ සඳහන් කරන මතය තහවුරු කරන්නෙකි. එය පවසන්නේ ජපානය හැර සියලුම කාර්මික රටවල පාහේ අපරාධ වැඩි වී ඇති බවයි.

## නිරීක්ෂණ

අපරාධ ඉහළ යෑම සමාජ සුභ සාධනයට සෘණ බලපෑම් ඇති කරයි. එබැවින් අපරාධ මර්ධනය සම්බන්ධයෙන් රජයේත් ජනතාවගේත් අවධානය යොමුවිය යුතු බැව් පෙනේ. අපරාධ වැළක්වීමේදී ප්‍රධාන වශයෙන් අපරාධ වලට හේතු අධ්‍යයනය කළ යුතු වේ. එය තරමක් අසීරු කාර්යයකි.

අපරාධ වැළැක්වීම සහ චූදිතයන්ට පිළියම් කිරීම සම්බන්ධයෙන් වු එක්සත් ජාතීන්ගේ 9 වන සභාව පෙන්වා දෙන පරිදි වැඩි වන අපරාධ, සැලසුම් නොකළ වැඩි වන නාගරිකරණය සමඟ දැඩි සබඳතාවක් දක්වයි. දරිද්‍රතාවයද

## ශ්‍රී ලංකාවේ අපරාධ හා ඒක පුද්ගල ආදායම 1990- 2000

*(1982 ස්ථාවර සාධක මිළ ගණන් අනුව*

| වර්ෂය | බරපතල අපරාධ | කොල්ලකෑම් | ගෙවල් බිඳුම් | මිනී මැරුම් | ස්ත්‍රී දූෂණ | Per capita income (RS) |
|---|---|---|---|---|---|---|
| 1990 | 48264 | - | - | - | - | 7605 |
| 1991 | 48356 | - | - | - | - | 7839 |
| 1992 | 46963 | 3638 | 9577 | 1423 | 371 | 8100 |
| 1993 | 43990 | 3189 | 9097 | 1286 | 386 | 8558 |
| 1994 | 52344 | 3618 | 10211 | 1336 | 518 | 8915 |
| 1995 | 53062 | 3698 | 10675 | 1614 | 542 | 9261 |
| 1996 | 51809 | 4064 | 10613 | 1775 | 716 | 9515 |
| 1997 | 57366 | 4393 | 12314 | 1828 | 909 | 9989 |
| 1998 | 56767 | 4778 | 12506 | 1919 | 1076 | 10343 |
| 1999 | 57376 | 4952 | 12870 | 1801 | 1309 | - |
| 2000 | 52941 | 4647 | 12666 | 1711 | 1202 | - |

මූලය : *IGPS Annual Report*
*(පොලිස්පතිගේ වාර්ෂික වාර්තාව)*

මෙම තත්ත්වය පවත්වාගෙන යෑමට උපකාර වන බවද මෙය පෙන්වා දෙයි. රැකියා අපේක්ෂාවෙන් නගරයට ඇදෙන වැඩි දෙනෙකුට ආරක්ෂාකාරී නිවාස නොමැති වීම අපරාධ වැඩිවීම හේතුවන බැව් මෙම සභාවේදී වාර්තාගත කර තිබේ. මේ නිසා අසමානාත්මතාවය අඩු කරන සහ සමාජ සාධාරණත්වය ලබා දෙන ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය පෙන්වා දී ඇත. සේවා වියුක්තිය හා දරිද්‍රතාව අපරාධ වැඩිවීමට මේ සමඟ සම්බන්ධ වී ඇත. මේ නිසා අපරාධ අඩු කිරීමේදී රැකියා අවස්ථා වැඩි කිරීම වැදගත්වේ. සමාජ සාධාරණත්වය, දාරිද්‍රතාවය හා සේවානියුක්තිය සම්බන්ධවන නිසා අපරාධ වැළැක්වීමේදී සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලටද වැදගත් කාර්ය භාරයක් හිමි වේ. කෙසේ වෙතත් මෙම තත්ත්වය දේපලවලට එරෙහිව සිදුවන අපරාධවලට අදාළ වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන තවත් වැදගත් අපරාධ මර්ධන උපකරණයක් වන්නේ පොලීසිය හා ජනතාව අතර සම්බන්ධතාව වැඩි කිරීමයි. මෙ සඳහා නව ක්‍රම භාවිතා කළ යුතු බවද එම සංවිධානය පෙන්වා දෙයි.

### අවසානය

අපරාධ සමාජ සුභ සාධනයට සෘජුවම බලපාන බවත් එය සමාජයට විශාල පිරිවැයක් ජනනය කරන බවත් පෙනේ. ආර්ථික වර්ධනය වැඩි වීමත් සමඟ තරඟකාරී තත්ත්වයෙන් ගිලිහෙන පුද්ගලයන් (*Losses of conpetition*) තම ආදායම වැඩි කර ගැනීමට විකල්ප ක්‍රම සෙවීමේ ප්‍රතිඵලයක් ලෙසද අපරාධ හඳුනාගත හැක. අපරාධකරුවාට අපරාධ කිරීමෙන් ලැබෙන ශුද්ධ ප්‍රතිලාභ ධන තත්ත්වයක පවතී නම් අපරාධ හා භව්‍ය අපරාධකරුවන් සඳහා ආකර්ශණීය තත්ත්වයක් ඇති කරයි. එබැවින් අපරාධ මර්දනයේදී නීති සම්පාදකයින්ට වැඩි වගකීමක් පැවරේ.

අපරාධ මර්දනයේදී දුගී බව තුරන් කිරීම හා රැකියා අවස්ථා වැඩි කිරීම බොහෝ රටවලට අදාළ වන අතර ඒවා රටේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සමඟ සෘජුවම බැඳී පවතී. එබැවින් අපරාධ මර්දනය පුළුල් ආර්ථික පරාසයක පැතිරී පවතින අතර රජයටද අපරාධ මර්දනයේදී විශාල වගකීමක් පැවරේ. කෙසේ වෙතත් ස්ත්‍රී දූෂණ වැනි අපරාද වල තත්ත්වය මීට වඩා වෙනස්වේ. එම අපරාධ මර්දනයේදී ඊට හේතු හඳුනා ගැනීම විශේෂයෙන් වැදගත් වේ. සංවර්ධිත රටක් වශයෙන් සැළකෙන නෝර්වේ රටෙහි *Leitf sand halt* (ලීෆ් සැන්ඩ් හෝල්ට්) 1982 දී මෙසේ පැවසිය. නොර්වේහි ජීවන තත්ත්වය පසුගිය වර්ෂ 30 සඳහා ඉහළ තත්ත්වයක පැවතුනි. එහෙත් සිය දිවි නසා ගැනීම දරුණු වී ඇත. මත් පැන් භාවිතය දෙගුණවී ඇත. මත් ද්‍රව්‍ය භාවිතය වැඩි වී ඇත. අපරාධ දෙගුණ වී ඇත. මිනී මැරුම් තෙගුණ වී ඇත. සමාජයට හානි දායක තත්ත්වයක් ඇති වී ඇත. සතුට නැති වී ඇත. එබැවින් ඔහුගේ ප්‍රකාශය අනුව සංවර්ධනය මැනීමේදී රටක ඒක පුද්ගල ආදායම ජීවන තත්ත්වය ආදී ධනාත්මක පැතිකඩ පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නොවේ. එම රටේ අපරාධ, හදිසි අනතුරු, සිය දිවිනසා ගැනීම් ආදී සෘණාත්මක පැත්තද සංවර්ධනය නිවැරදිව මැනීමේදී අවශ්‍ය වේ.

අපරාධ මර්ධනයේදී තවත් වැදගත් කාරණයක් වන්නේ අපරාධ වල නිරත වී මේදී අපරාධකරුවාට ලැබෙන පිරිවැය හා ප්‍රතිලාභයයි. දඩුවම් අඩුවීමකින් සහ නීතිරීති ලිහිල් වීමෙන් අපරාධකරුවාගේ පිරිවැය අඩුවන නිසා අපරාධ ඔහුට ලාභදායී එකක් වේ. එබැවින් දඩුවම් වැඩි කිරීමෙන් අපරාධ අඩු නොවන බවට පවතින තර්කයට එරෙහිව සාක්ෂියක් ගොඩනැගීමට මෙය හොඳ අවස්ථාවකි.